[8. සනිමිත්තවග්ගො]

2. 2. 8. 1.

[සාවජ්ජනිදානං:]

27. සනිමිත්තා භික්ඛවෙ උප්පජ්ජන්ති පාපකා අකුසලා ධම්මා, නො අනිමිත්තා. තස්සෙව නිමිත්තස්ස පහානා එවං තෙ පාපකා අකුසලා ධම්මා න හොන්ති.[1]

2. 2. 8. 2.

28. සනිදානා භික්ඛවෙ උප්පජ්ජන්ති පාපකා අකුසලා ධම්මා, නො අනිදානා. තස්සෙව නිදානස්ස පහානා එවං තෙ පාපකා අකුසලා ධම්මා න හොන්ති.

2. 2. 8. 3.

29. සහෙතුකා භික්ඛවෙ උප්පජ්ජන්ති පාපකා අකුසලා ධම්මා, නො අහෙතුකා. තස්සෙව හෙතුස්ස පහානා එවං තෙ පාපකා අකුසලා ධම්මා න හොන්ති.

2. 2. 8. 4.

30. සප්පච්චයා භික්ඛවෙ උප්පජ්ජන්ති පාපකා අකුසලා ධම්මා, නො අප්පච්චයා. තස්සෙව පච්චයස්ස පහානා එවං තෙ පාපකා අකුසලා ධම්මා න හොන්ති.

2. 2. 8. 5.

31. සරූපා භික්ඛවෙ උප්පජ්ජන්ති පාපකා අකුසලා ධම්මා, නො අරූපා. තස්සෙව රූපස්ස පහානා එවං තෙ පාපකා අකුසලා ධම්මා න හොන්ති.

2. 2. 8. 6.

32. සවෙදනා භික්ඛවෙ උප්පජ්ජන්ති පාපකා අකුසලා ධම්මා, නො අවෙදනා. තස්සායෙව වෙදනාය පහානා එවං තෙ පාපකා අකුසලා ධම්මා න හොන්ති.

2. 2. 8. 7.

33. සසඤ්ඤා භික්ඛවෙ උප්පජ්ජන්ති පාපකා අකුසලා ධම්මා, නො අසඤ්ඤා. තස්සායෙව සඤ්ඤාය පහානා එවං තෙ පාපකා අකුසලා ධම්මා න හොන්ති

2. 2. 8. 8.

34. සසඞ්ඛාරා භික්ඛවෙ උප්පජ්ජන්ති පාපකා අකුසලා ධම්මා, නො අසඞ්ඛාරා. තෙසංයෙව සඞ්ඛාරානං පහානා එවං තෙ පාපකා අකුසලා ධම්මා න හොන්ති.

1. න හොන්තීති - මජසං, සහ, PTS.

[8. සනිමිත්ත වර්ගය]

2. 2. 8. 1

[සැවැත්නිදානයි:]

27. මහණෙනි, ලාමක අකුසලධර්මයෝ සනිමිත්ත ව උපදිත්. අනිමිත්ත ව නූපදිත්. ඒ නිමිත්තයාගේ ප්‍රහාණයෙන් මෙසේ ඒ ලාමක අකුසලධර්මයෝ නො වෙත් ය යි.

2. 2. 8. 2.

28. මහණෙනි, ලාමක අකුසලධර්මයෝ සනිදාන ව උපදිත්. අනිදාන ව නූපදිත්. ඒ නිදානයාගේ ම ප්‍රහාණයෙන් මෙසේ ඒ ලාමක අකුසලධර්මයෝ නො වෙත් ය යි.

2. 2. 8. 3.

29. මහණෙනි, ලාමක අකුසලධර්මයෝ සහේතුක ව උපදිත්. අහේතුක ව නූපදිත් ඒ හේතුහුගේ ම ප්‍රහාණයෙන් මෙසේ ඒ ලාමක අකුසලධර්මයෝ නො වෙත් ය යි.

2. 2. 8. 4.

30. මහණෙනි, ලාමක අකුසලධර්මයෝ සංස්කාර සහිත ව උපදිත්. සංස්කාර රහිත ව නූපදිත්. ඒ සංස්කාරයන්ගේ ම ප්‍රහාණයෙන් මෙසේ ඒ ලාමක අකුසලධර්මයෝ නො වෙත් ය යි.

2. 2. 8. 5.

31. මහණෙනි, ලාමක අකුසලධර්මයෝ ප්‍රත්‍යය සහිත ව උපදිත්. ප්‍රත්‍යය රහිත ව නූපදිත් ඒ ප්‍රත්‍යයාගේ ම ප්‍රහාණයෙන් මෙසේ ඒ ලාමක අකුසලධර්මයෝ නො වෙත් ය යි

2. 2. 8. 6.

32. මහණෙනි, ලාමක අකුසලධර්මයෝ රූපසහිත ව උපදනාහ. රූප රහිත ව නූපදනාහ. ඒ රූපයාගේ ම ප්‍රහාණයෙන් මෙසේ ඒ ලාමක අකුසලධර්මයෝ නො වත් හ යියි.

2. 2. 8. 7.

33. මහණෙනි, ලාමක අකුසලධර්මයෝ වේදනා සහිත ව උපදනා හ. වේදනා රහිත ව නූපදනා හ. ඒ වේදනාහුගේ ම ප්‍රහාණයෙන් මෙසේ ඒ ලාමක අකුසලධර්මයෝ නො වන්නාහ යි.

2. 2. 8. 8.

34. මහණෙනි, ලාමක අකුසලධර්මයෝ සංඥා සහිත ව උපදනාහ. සංඥා රහිත ව නූපදනාහ. ඒ සංඥාහුගේ ම ප්‍රහාණයෙන් මෙසේ ඒ ලාමක අකුසලධර්මයෝ නොවන්නා හයි.

2. 2. 8. 9.

35. සවිඤ්ඤාණා භික්ඛවෙ උප්පජ්ජන්ති පාපකා අකුසලා ධම්මා, නො අවිඤ්ඤාණා. තස්සෙව විඤ්ඤාණස්ස පහානා එවං තෙ පාපකා අකුසලා ධම්මා න හොන්ති.

2. 2. 8. 10.

36 සඞ්ඛතාරම්මණා භික්ඛවෙ උප්පජ්ජන්ති පාපකා අකුසලා ධම්මා, නො අසඞ්ඛතාරම්මණා. තස්සෙව සඞ්ඛතස්ස පහානා එවං තෙ පාපකා අකුසලා ධම්මා න හොන්තීති.

වග්ගො අට්ඨමො

[9. ධම්මවග්ගො]

2. 2. 9. 1.

[සාවත්ථිනිදානං:]

37. ද්වෙමෙ භික්ඛවෙ ධම්මා. කතමෙ ද්වෙ: චෙතොවිමුත්ති ච පඤ්ඤා-විමුත්ති ච. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ ධම්මාති.

2. 2. 9. 2.

38. ද්වෙමෙ භික්ඛවෙ ධම්මා, කතමෙ ද්වෙ: පග්ගහො ච අවික්ඛෙපො ච. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ ධම්මාති.

2. 2. 9. 3.

39. ද්වෙමෙ භික්ඛවෙ ධම්මා, කතමෙ ද්වෙ: නාමඤ්ච, රූපඤ්ච. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ ධම්මාති.

2. 2. 9. 4.

40. ද්වෙමෙ භික්ඛවෙ ධම්මා. කතමෙ ද්වෙ: විජ්ජා ච විමුත්ති ච. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ ධම්මාති.

2. 2. 9. 5.

41. ද්වෙමෙ භික්ඛවෙ ධම්මා. කතමෙ ද්වෙ: භවදිට්ඨි ච විභවදිට්ඨි ච. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ ධම්මාති

2. 2. 8. 9.

35. මහණෙනි, ලාමක අකුශලධර්මයෝ විඥාන සහිත ව උපදනාහු. විඥාන රහිත ව නූපදනාහු. ඒ විඥානයාගේ ම ප්‍රහාණයෙන් මෙසේ ඒ ලාමක අකුශලධර්මයෝ නො වන්නාහු යි.

2. 2. 8. 10.

36. මහණෙනි, ලාමක අකුශලධර්මයෝ (හේතුප්‍රත්‍යයෙන් උපන්) සංස්කෘතය අරමුණු කොට උපදනාහු. (හේතුප්‍රත්‍යයෙන් නූපන්) අසංස්කෘතය අරමුණු කොට නූපදනාහු. ඒ සඞ්ඛතයාගේ ම ප්‍රහාණයෙන් මෙසේ ඒ ලාමක අකුශලධර්මයෝ නො වන්නාහු යි.

අටවන වග යි.

[9. ධර්මවර්ගය]

[සැවැත් නිදානයි:]

2. 2. 9. 1.

37. මහණෙනි, මේ ධර්ම දෙකෙකි. කවර දෙකෙක යත්: (ඵලසමාධි සඞ්ඛ්‍යාත) චේතෝවිමුක්තිය හා (ඵලප්‍රඥා සඞ්ඛ්‍යාත) ප්‍රඥාවිමුක්තිය හා යන දෙකයි. මහණෙනි, මේ වනාහි ධර්ම දෙක යි.

2. 2. 9. 2.

38. මහණෙනි, මේ ධර්ම දෙකෙකි. කවර දෙකෙක යත්: (වීර්‍යසඞ්ඛ්‍යාත) ප්‍රග්‍රහය හා (චිත්තෛකාග්‍රතා සඞ්ඛ්‍යාත) අවික්ෂේපය හා යන දෙකයි. මහණෙනි, මේ වනාහි ධර්ම දෙක යි.

2. 2. 9. 3.

39. මහණෙනි, මේ ධර්ම දෙකෙකි. කවර දෙකෙක යත්: (සතර අරූපස්කන්ධ සඞ්ඛ්‍යාත) නාමය හා රූප (ස්කන්ධ) ය හා යන දෙකයි. මහණෙනි, මේ වනාහි ධර්ම දෙක යි.

2. 2. 9. 4.

40. මහණෙනි, මේ ධර්ම දෙකෙකි. කවර දෙකෙක යත්: (ඵලඥාන සඞ්ඛ්‍යාත) විද්‍යාව හා (ඵලඥාන සම්ප්‍රයුක්ත සෙසු ධර්ම සඞ්ඛ්‍යාත) විමුක්තිය හා යන දෙකයි. මහණෙනි, මේ වනාහි ධර්ම දෙක ය

2. 2. 9. 5.

41. මහණෙනි, මේ ධර්ම දෙකෙකි. කවර දෙකෙක යත්: (ශාශ්වත සඞ්ඛ්‍යාත) භවදෘෂ්ටිය හා (උච්ඡේද සඞ්ඛ්‍යාත) විභවදෘෂ්ටිය හා යන දෙක යි. මහණෙනි, මේ වනාහි ධර්ම දෙක ය.

Free Distribution www.aathaapi.org